Embassy of the United States of America

Colombo

# PRESS RELEASE

Public Affairs Section

Tel: +94 (1) 249-8100 Fax: +94 (1) 244-9070
Email: shenjy@state.gov Web: lk.usembassy.gov

Release No. 20161208S

## ලෝක ප්‍රකට බැට්‍රි ඩාන්ස් (Battery Dance) ශ්‍රී ලංකාවේ සංචාරය කරයි

**කොළඹ, දෙසැම්බර් 8, 2016**: ලෝක ප්‍රකට බැට්‍රි ඩාන්ස් (Battery Dance) කණ්ඩායම තම ශ්‍රී ලංකා සංචාරය, චන්දන වික්‍රමසිංහ නර්තන සංසදය සහ අසෝක වික්‍රමරත්න ගේ නාඩරෝ කණ්ඩායම සමඟ, දෙසැම්බර් 12 දින බිෂොප් විද්‍යාලයේ අති උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට නියමිත 'ඩ්‍රම්ස් ඇන්ඩ් ඩාන්ස්' (Drums and dance) ප්‍රසංගයෙන් අවසන් කිරීමට කටයුතු යොදා ඇත. මෙම මහජන ප්‍රසංගය, බැට්‍රි ඩාන්ස් කණ්ඩායම සති දෙකක් පුරා ශ්‍රී ලාංකික නර්තන කණ්ඩායම් සමඟ පැවැත්වූ හුවමාරු වැඩසටහන්, ගෞරව සංදර්ශන සහ දේශීය සිසුන් සමඟ සිදුකළ පුහුණු වැඩසටහන් පෙළේ අවසානය සනිටුහන් කරන්නේය.

වැඩ බලන ඇමෙරිකානු තානාපති රොබර්ට් හිල්ටන් පැවසුයේ, දෙරට අතර පවතින ශක්තිමත් සංස්කෘතින් සහ දෙරට ජනතාව අතර පවතින සබඳතාවල  අභිවෘද්ධිය සඳහා මෙලෙස බැට්‍රි ඩාන්ස් කණ්ඩායම නැවතත් ශ්‍රී ලංකාවට ගෙන්වීම පිළිබඳ ඇමෙරිකානු තානාපති කාර්යාලය ආඩම්බර වන බවයි.

නිව්යෝක් නුවර සිට පැවතෙන බැට්‍රි ඩාන්ස් කණ්ඩායම විසින් පසුගිය වසර 40 තුළ රටවල් 62ක, විවිධ ගැටුම් පවතින ස්ථානයන්හි සමාජයෙන් කොන් කර ඇති කණ්ඩායම් අතර සබඳතා ගොඩනැංවීමට කටයුතු කර ඇත. ඒ සඳහා ඔවුන් යොදා ගන්නේ 'Dancing to connect' (සම්බන්ධ වීමට නර්තනයේ යෙදීම) යන දර්ශනයයි. මෙමගින් විවිධ ප්‍රජාවන් එක් කොට කලාත්මක විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම, අනාගතයේ තරුණ නායකයින් බිහිකිරීම සහ නර්තනය සැමට නිරත විය හැකි අංශයක් බවට පත් කිරීම සිදු වන්නේය.

වැඩ බලන තානාපති රොබර්ට් හිල්ටන් පවසන පරිදි මෙතුලින් ප්‍රේක්ෂකයින් හට තමා ප්‍රිය කරන කලාවන් රසවිඳීමට හොඳ අවස්ථාවක් ලැබෙනවා පමණක් නොව, තානාපති කාර්යාලයේ සංස්කෘතික වශයෙන් පවත්වන රාජ්‍ය තාන්ත්‍රික කටයුතු ද පරිපූර්ණ වන්නේය. "එක්සත්, ප්‍රජාතන්ත්‍රවාදී සහ සැමට සම අවස්ථා සැලසෙන ශ්‍රී ලංකාවක් සඳහා ශ්‍රී ලාංකික ජනතාව තුල පවතින උනන්දුව එක්සත් ජනපදය අගය කරන්නේය."

ඔවුන්ගේ සංචාරය අතරතුර, බැට්‍රි ඩාන්ස් කණ්ඩායමේ සංකේතාත්මක 'රාග් දූර්ගා' නර්තනය නැට්ෆෙස්ට් (NatFest) නර්තන උත්සවයේදී වේදිකාගත කල අතර චිත්‍රසේන නර්තන කණ්ඩායමේ ප්‍රධාන නර්තනකරුවන් කිහිපයකටද වැඩමුළු පවත්වන ලදී.  තවද, ඔවුන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිසුන් හට වැඩමුළුවක් සහ ගේට්වේ පාසල් ශ්‍රවනාගාරයේදී නොමිලයේ ප්‍රසංගයක් ද පවත්වන ලදී. එමෙන්ම, බැට්‍රි ඩාන්ස් කණ්ඩායමේ නිර්මාතෘ සහ කලාත්මක අධ්‍යක්ෂක ජොනතන් හොලැන්ඩර් සහ නිෂ්පාදන කළමනාකරු බැරී ස්ටීල් කලාවන් හි ව්‍යාපාරික අවස්ථාවන් පිළිබඳව මහජන දේශනයක්ද පවත්වන ලදී.

බැට්‍රි ඩාන්ස් කණ්ඩායම පළමු වතාවට ශ්‍රී ලංකා සංචාරයක නිරත වුයේ 2006 දීය.

###